සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාරපරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
Second Term Test - 2018 | Grade 11

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය II
Communication & Media Studies II

කාලය පැය 2
Two hours

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය සහ තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් සමඟ පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද තෝර ගනු ලබන් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

---

01) එකම විශ්ව විද්‍යාලයක මිතුරු මිතුරියන්වූ සුමුදු/කවිදු/ හා පසිදු තම අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරිමෙන් පසු ජනමාධ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධවයි.

කවිඳු - රූපවාහිනි වැඩසටහන් අධ්‍යක්ෂක
සුමුදු - ගුවන්විදුලි වැජසටහන් නිෂ්පාදිකා
පසිඳු - පුවත්පත් වාර්තාකරු

I. මොවුන් තිදෙනා සම්බන්ධ වී ඇති සන්නිවේදන වර්ගය කුමක්ද ?
II. ගුවන්විදුලිය හා රූපවාහිනි මාධ්‍ය හැඳින්වීමට පොදුවේ භාවිත කරන පදය කුමක්ද ?
III. කවිදුටසිය වෘත්තිය භූමිකාව තුළ සහභාගි විය හැකි වැඩසටහන් ප්‍රභේද හතරක් සඳහන් කරන්න.
IV. රූපවාහිනි වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියෙහි තිබූ වෘත්තීය සීමා හාසෞන්දර්යාත්මක නියම වෙනස් කරමින් වර්ථමානයේ රූපවාහිනි නාලිකාවල බහුලව දැකිය හැකි වැඩසටහන් ප්‍රභේදය කුමක්ද?
V. රූපවාහිනයි ගුවන්විදුලිය ආදී ජන මාධ්‍යයන් අලුත් තොරතුරු ලබා ගැනිමට හා නව ආකල්ප මතු කර ගැනිමට අපේක්ෂාවෙන් සිදු කරන වැඩසටහන කුමක් නමින් හැඳින්වේ ද?
VI. ගුවන්විදුලි වැඩසටහනකදී පසුබිම් කථනය සඳහා වෙනත් ශිල්පීයෙකු යොදා ගැනිමට සුමුදුට සිදුවිය. එවැන්නෙකු සතුවිය යුතු මූලික කුසලතා දෙකක් නම් කරන්න.
VII. සුමුදු සහ පසිඳු සම්බන්ධවී ඇති මාධ්‍යයේදී ග්‍රාහකයා හඳුන්වනු ලබන ආකාර දෙක සඳහන් කරන්න.
VIII. නිහඬ සිනමාව තම හැකිය ප්‍රදර්ශනයට ආශිර්වාදයක් කරගත් නිර්මාන ශිල්පීයාගේ නම සඳහන් කරන්න.

IX. පසිඳු සම්බන්ධ වී ඇති මාධ්‍ය හා සම්බන්ධ රජයට කොටස් හිමි පුවත්පත් ආයතනය කුමක්ද ?

X. මාධ්‍ය මගින් ඉදිරිපත් කරන තොරතුරුවලට මනා පිළිගැනීමක් හිමිවීමට ඒවා සතුවිය යුතු ගුණාංග හතර සඳහන් කරන්න.

02)

I. යුනෙස්කෝ අර්ථකථනයට අනුව පොතක තිබිය යුතු අවම පිටු ගනන 38 කි. ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

II. "පුද්ගල හා සමාජය කොටස් දෙකකට බෙදා වෙන් කිරීම අපහසු වුවත් අධ්‍යාපනයේ පහසුව සඳහා තොරතුරු දැන ගනිමේ අවශ්‍යතාවය ප්‍රධාන කොටස් දෙකක් යටතේ බෙදා දක්වා ඇත. " ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ? ඔබගේ පිළිතුරට හේතු දෙකක් දක්වන්න.

III. "පුවත්පත් සඳහා ප්‍රවෘත්ති වාර්තා කිරිමේදී යටිකුරු පිරමීඩ ක්‍රමය භාවිත කිරීම වාර්තාකරුවන්ට මෙන්ම ග්‍රහකයාට ඉතා වැදගත්ය" ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ? ඔබගේ පිළිතුරට හේතු තුනක් දක්වන්න.

IV. ගුවන් විදුලියි ප්‍රබල ජනමාධ්‍යයක් වුවත් ඊට ආවේනික දුබලතා දක්නට නොලැබේ. ඉහත ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ? ඔබගේ පිළිතුරට හේතු හතරක් දක්වන්න.

03) "කුසට ආහාර මෙන්ම මනසට තොරතුරු ලබා ගැනිමේ පිපාසයකින් මානවයා පෙළෙයි." ඒ අනුව මාධ්‍යයන් නූතනයේ තොරතුරු වාර්තාකරණයට ප්‍රධාන තැනක් වෙන්කර ඇත.

I. තොරතුරු වර්තාකරයේ ප්‍රධාන අවස්ථාවන් දෙකක් දක්නට ලැබෙන අතර එය සාමාන්‍ය සමාජයේ පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුවීම සහ ප්‍රවෘත්ති වාර්තාකරණයයි. මෙම අවස්ථා දෙකේදීම බහුලව යොදාගන්නා වාර්තාකරණ ක්‍රම දෙක හඳුන්වන්න.

II. ප්‍රවෘත්තියක අන්තර්ගතය හා ස්වභාවය සලකා බැලිමේදී දැකිය හැකි ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රභේද දෙක නම් කරන්න.

III. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

IV. සන්නිවේදන කාර්යයට අවශ්‍ය තොරතුරු ලබා ගැනිම සඳහා යොදා ගත හැකි තොරතුරු මූලාශ්‍ර හතර පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

04)

I. ශ්‍රී ලංකාවේ දැනට බහුලව භාවිත වන ගුවන්විදුලි තරංග වර්ගය කුමක්ද ?

II. ගුවන් විදුලි පිටපත් රචකයාට පෙර සූදානම් වීමක් තිබිය යුතුය. එසේ පෙර සූදානම්වීමේදී අවධානය යොමු කරන කරුණු දෙකක් නම් කරන්න.

III. නව මාධ්‍යයේ දැකිය හැකි ලක්ෂණ තුනක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

IV. රූපවාහිනි මාධ්‍යයේ දැකිය හැකි ලක්ෂණ හතරක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

05)

කැමරාවෙන් ඡායාරූප ගැනිම ඉතා නිර්මාණශිලී කාර්යයකි. එහිදී බලපාන්නේ පුද්ගලයාගේ නිර්මාණශිලී ඇස හා චින්තනයයි.

I. ඡායාරූපකරණය වෘත්තීය හැර ඡායාරූපකරණය හා සම්බන්ධ තවත් වෘත්තීන් දෙකක් නම් කරන්න.
II. නිශ්චල කැමරාව සදහා යොදාගත හැකි කාච වර්ග හතර සඳහන් කරන්න.
III. සිනමාව හා රූපවාහිනි මාධ්‍ය සදහා නිශ්චල ඡායාරූප භාවිත කිරිමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් කෙටියෙන් සඳහන් කරන්න.
IV. නිශ්චල ඡායාරූප භාවිත නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි හතරක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

06)




I. ඉහත රූප සටහනෙහි දක්වෙන A හා B නම් කරන්න
II. සත්ව සන්නිවේදනය මගින් සතුන් සපුරා ගන්නා මුලික අවශ්‍යතා හතරක් ලියන්න.
III. සන්නිවේදන මුලිකාංග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.
IV. සන්නිවේදන කාර්යයන් හතරක් විස්තර කරන්න.

07) සමාජයක පැවැත්ම සඳහා සන්නිවේදනය අත්‍යවශ්‍ය සාධකයකි. පුද්ගලයාගේ සන්නිවේදනය විවිධාරකාරයෙන් සිදුකරනු ලබයි.

I. සන්නිවේදන ස්වරූප දෙකක් සදහන් කරන්න.
II. සමුහයක් තුළ සිදුකරන සන්නිවේදනයේදී විවිධ මාධ්‍ය උපකරණ භාවිත කරයි. ප්‍රක්ෂේපණීය හා ප්‍රක්ෂේපණිය නොවන උපකරණ එක බැගින් සඳහන් කරන්න.
III. ඵලදායි ලේඛනයක දැකිය හැකි ලක්ෂණ තුනක් පිළිබද කෙටි විස්තරයක් කරන්න.
IV. ජන සන්නිවේදනයේ දැකිය හැකි ලක්ෂණ හතරක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.